# අන්ධකාර සූත්‍රය

(සං.නි. V (2), බු.ජ.ත්‍රි., 316-318 පිටු)

සංයුත්ත නිකායෙහි සච්ච සංයුත්තයෙහි ඇතුළත් මෙම සූත්‍රය භාග්‍යවතුන් වහන්සේ ලොව පවත්නා අන්ධකාරය විස්තර කරමින් දේශනා කරන ලද්දකි. ලෝවැසි සත්ත්වයන් සාමාන්‍යයෙන් දන්නේ සූර්යාලෝකය නොමැති විට පවත්නා අන්ධකාරය පමණි. එහෙත් බුදුරජාණන් වහන්සේ මෙහි දී අපට ලොව පවත්නා සැබෑ අන්ධකාරය කුමක්දැයි පහදා දෙමින් අපට බුද්ධිය ලබා දෙති.

*'මහණෙනි, ලොවට මහත් ආලෝකයක් සපයන සඳහිරු දෙදෙනාගේ ආලෝකය යම් තැනෙක නොලබත් නම් ලෝකාන්තරික (ලොව අතර පවතන්නා) වූ හිස් වූ ආවරණ රහිත වූ අඳුරු කරන එබඳු ගන අඳුරක් ලොව පවතී'* යයි බුදුරජාණන් වනහන්සේ වරෙක භික්ෂූන් අමතා ප්‍රකාශ කළහ. මෙලෙස ඒකාන්තයෙන් මහත් වූ අඳුරට වඩා ඉතා බිහිසුණු අඳුරක් ලොව ඇද්දැයි එක්තරා භික්ෂු නමක් මෙහි දී ප්‍රශ්න කළේ ය. එවිට බුදුරජාණන් වහන්සේගේ පිළිතුර වූයේ එබඳු බිහිසුණු අඳුරක් ලොව පවතින බවයි. එනම්,

යම්කිසි භික්ෂුවක් හෝ ශ්‍රමණ බ්‍රාහ්මණයෙක් හෝ යම් තැනැත්තෙක්

**මේ දුක යැයි යථා පරිදි නොදනී නම් (*ඉදං දුක්ඛ'න්ති යථාභූතං නප්පජානාති*)**
**මේ දුකට හේතුව යයි යථා පරිදි නොදනී නම් (*ඉදං දුක්ඛ සමුදයන්ති යථාභූතං නප්පජානාති*)**
**මේ දුකෙහි නිරෝධය යයි යථා පරිදි නොදනී නම් (*ඉදං දුක්ඛ නිරෝධන්ති යථාභූතං නප්පජානාති*)**
**මේ දුක නිරෝධ කරන මාවත යයි යථා පරිදි නොදනී නම් (*ඉදං දුක්ඛ නිරෝධගාමිනී පටිපදන්ති යථාභූතං නප්පජානාති* )**

**ඔහු ජාති, ජරා, මරණ, සෝක - පරිදේව - දුක් - දොම්නස් ලැබීමට හේතුවන දෙයෙහි සතුටු වෙයි. එහි ඇලෙයි. එබඳු දේ රැස්කරයි.** ඒවා රැස්කොට ජාති අඳුරට ද වැටෙයි. ජරා අඳුරට ද වැටෙයි. මරණ අඳුරට ද වැටෙයි. සෝක පරිදේව දුක් දොම්නස් අඳුරට ද වැටෙයි. ඔහු ජාති, ජරා, මරණ, සෝක පරිදේව දුක් දොම්නස්වලින් නොමිදෙයි.

මෙලෙස චතුරාර්ය සත්‍යය නොදැනීම (අවිද්‍යාව) නමැති අඳුර ලොව පවත්නා ඉතා ම බිහිසුණු අඳුර ලෙස භාග්‍යවතුන් වහන්සේ දේශනා කළහ. එම අවිද්‍යාව සිතෙහි පහළ වන බලවත් ම මළය ලෙස දක්වා තිබේ (*අවිජ්ජා පරමං මලං*). අවිද්‍යාව නමැති අඳුර දුරුවීම උතුම් (*අවිජ්ජා නිපපතතං වරෝ*) බවත් විද්‍යාව නමැති ප්‍රඥාව පහළ වීම උතුම් (*විජ්ජා උප්පතතං සෙට්ඨා*) බවත් දක්වා තිබේ.

මෙලෙස අවිද්‍යාන්ධකාරය හටගන්නා අනුපිළිවෙළ භාග්‍යවතුන් වහන්සේ ඉතා පැහැදිලිව පෙළ දහමෙහි දක්වා තිබේ. ඒ අනුව අවිද්‍යාව හටගන්නේ කාමච්ඡන්දාදි පංච නීවරණ හේතුවෙනි. පංචනීවරණවලට හේතුව (කාය, වාක්, මනෝ යන) ත්‍රිවිධ දුශ්චරිතයි. ත්‍රිවිධ දුශ්චරිතයට හේතුව ඉන්ද්‍රිය අසංවරයයි. ඉන්ද්‍රිය අසංවරයට හේතුව අසති අසම්පජඤ්ඤයයි. අසති අසම්පජඤ්ඤයට හේතුව අයෝනිසෝ මනසිකාරයයි. අයෝනිසෝ මනසිකාරයට හේතුව අශ්‍රද්ධාවයි. අශ්‍රද්ධාවට හේතුව අසද්ධර්ම ශ්‍රවණයයි. අසද්ධර්ම ශ්‍රවණයට හේතුව අසත්පුරුෂ ආශ්‍රයයි. මෙලෙස සලකා බැලීමේදී පෙනී යන ප්‍රධාන කරුණක් නම් අවිද්‍යාන්ධකාරය හටගැනීමට මූල හේතුව වන්නේ අනුවණ අසත්පුරුෂයන්ගේ ඇසුර බවයි. එමගින් මුළු ජීවිතය ම අඳුරින් වැසී යයි. සියලු යහපත නැසී යයි.

යමෙක් ඉහත දක්වූ දුක්ඛ, සමුදය, නිරෝධ, මග්ග යන චතුරාර්ය සත්‍යය නුවණින් දකී ද ඔහු ජාති, ජරා, මරණ, සෝක පරිදේව ලැබීමට හේතුවන දෙයෙහි සතුටු නොවෙයි. එහි නොඇලෙයි. එබඳු දේ රැස් නොකරයි. ඒවා රැස් නොකිරීම හේතුවෙන් ජාති අඳුරට, ජරා අඳුරට, මරණ අඳුරට, සෝක පරිදේව දුක් දොම්නස් අඳුරට නොවැටෙයි. ඒ හේතුවෙන් ඔහු ජාති, ජරා, මරණ, සෝක, පරිදේව දුක් දොම්නස්වලින් මිදී අතිශය තෘප්තිමත් ජීවිතයක් ගත කරයි. එබැවින් චතුරාර්ය සත්‍යය අවබෝධ කර ගැනීම සඳහා අප්‍රමාදීව උත්සාහ කළ යුතු බව බුදුරජාණන් වහන්සේ මෙහි දී අපට උපදෙස් දෙති. බුද්ධෝත්පාද කාලයක ක්ෂණ සම්පත්තිය ලබා මෙලොව උපදින බුද්ධිමත් මනුෂ්‍යයකුගේ ප්‍රධාන ජීවිත අභිලාශය විය යුත්තේ චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධය ලබා අවිද්‍යාව දුරුකොට දුකින් නිදහස් වීමයි.

මෙලෙස යමෙක් අවිද්‍යාව නමැති අඳුරින් දුරු වෙයි නම් එය ලොව පවත්නා උසස් ම ආලෝකය ලෙස දක්වා තිබේ. එය **විජ්ජා, සම්මා දිට්ඨි, පඤ්ඤා, ආලෝකො** ආදි නම්වලින් බුදුසමයෙහි සඳහන් ව ඇත. බුදුදහමට අනුව යම් පුද්ගලයකු ලබන උසස්තම දියුණුව වන්නේ චතුරාර්ය සත්‍යය දැනීම් සංඛ්‍යාත විද්‍යාවිමුක්තිය සාක්ෂාත් කර ගැනීමයි. එනම් දුකින් නිදහස් වීමයි. මෙලෙස ලොව පවත්නා යථා ස්වභාවය නුවණින් අවබෝධ කොට ගෙන දුකින් නිදහස් වීමට අවශ්‍ය මාවත පිළිබඳව ද බුදුරජාණන් වහන්සේ මහාකරුණාවෙන් හා මහාප්‍රඥාවෙන් යුතුව අනුපිළිවෙළින් ලොවට දේශනා කළහ.

දුකින් නිදහස්ව ලබන විද්‍යා විමුක්තිය සාක්ෂාත් කර ගැනීම සඳහා ආසන්නතම හේතුව වශයෙන් දක්වා ඇත්තේ සත්ත බොජ්ඣංග වැඩීමයි. එනම් සති, ධම්මවිජය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන බෝධි අංග ප්‍රගුණ කිරීමයි. මෙලෙස බොජ්ඣංග වැඩෙන්නේ (කාය, වේදනා, චිත්ත, ධම්ම යන) සතර සතිපට්ඨානය සම්පූර්ණ කිරීමෙනි. සතර සතිපට්ඨානය සම්පූර්ණ වීමට (කාය, වාක්, මනෝ යන) ත්‍රිවිධ සුචරිතය ප්‍රගුණ කිරීමත්, ත්‍රිවිධ සුචරිතය ප්‍රගුණ වීමට ඉන්ද්‍රිය සංවරයත් අවශ්‍ය කෙරේ. ඉන්ද්‍රිය සංවරය දියුණුවීමට සති සම්පජඤ්ඤය (සිහිය හා නුවණ) ද සතිසම්පජඤ්ඤය දියුණුවීමට යෝනිසෝ මනසිකාරය (නුවණින් මෙනෙහි කිරීම) ද යෝනිසෝ මනසිකාරය දියුණු වීමට ශ්‍රද්ධාව (තෙරුවන කෙරෙහි ප්‍රසාදය හා විශ්වාසය) ද ශ්‍රද්ධාව දියුණු වීමට සද්ධර්මශ්‍රවණය (චතුරාර්ය සත්‍ය සංඛ්‍යාත සැබෑ දහමක් ඇසීම) ද සද්ධර්මශ්‍රවණය ලැබීමට සත්පුරුෂ ආශ්‍රය ද අවශ්‍ය කෙරේ. මේ අනුව සලකා බැලීමේ දී පැහැදිලි වන කරුණක් නම් ආධ්‍යාත්මික ගමන් මගෙහි සියලු ගුණ රුවන් වැඩෙන්නේ කල්‍යාණ ගුණ ඇති සත්පුරුෂ ආශ්‍රය තම ජීවිත තුළට ලැබීමෙන් බවයි.

විද්‍යාවිමුක්තිය නම් වූ ආලෝකය ජීවිත තුළට ලැබෙන්නේ සම්මා දිට්ඨිය නම් වූ යහපත් දැක්ම ජීවිතයට ලැබීමෙනි. එහි පළමු පියවර වන්නේ **'කම්මස්සකතා සම්මා දිට්ඨිය'** නම් වූ කුසල-අකුසල කර්ම ඵල ඇදහීමේ ලක්ෂණයයි. ඒ අනුව අකුසල කර්ම කිරීමෙන් අයහපත්, අමිහිරි විපාකත් කුසල් වැඩීමෙන් යහපත්, මිහිරි ආනිසංසත් තම ජීවිතයට ලැබෙන බවට නුවණ දියුණු වේ. ඒ සමග ම හැකිතාක් අකුසලයෙන් මිදී කුසල් වැඩීමෙහි බලවත් කැමැත්තක් ඡන්දයක් හට ගනී. ධර්මයෙහි පවත්නා සුවිශේෂ ලක්ෂණ දෙකක් නම් සන්දිට්ඨික හා අකාලික බවයි. සන්දිට්ඨික යනු මේ ජීවිතය තුළදී ම ඵලවිපාක ලැබෙන බවයි. අකාලික යනු කල් නොගොස් ආනිසංස ලැබෙන බවයි. මෙම දහම් ගුණාංග පිළිබඳ අවබෝධයක් ඇති නුවණැති තැනැත්තා තම ජීවිතය තුළ හැකිතාක් දාන, ශීල, භාවනා යන පුණ්‍ය ධර්ම සිදු කර ගනී. පින් රැස් කර ගැනීම සැප රැස් කර ගැනීමක් (*සුඛෝ පුඤ්ඤස්ස උච්චයෝ*) ලෙස දකින ශ්‍රැතවත් තැනැත්තා මෙලොව ජීවිතයේ දී ම ප්‍රතිඵල අපේක්ෂාවෙන් අකුසලයෙන් අතමිදී පිනින් බර ජීවිතයක් ගත කරයි. අපගේ අතීතය සිහිවන විට ඒ පිළිබඳව සතුටින් සිහිකළ හැකි අයුරින් තම ජීවිතයෙහි පින්දහම් සිදු කර ගනී.

ඒ අතර සම්මා දිට්ඨියෙහි දෙවන පියවර වන **'චතුසච්ච සම්මා දිට්ඨිය'** හෙවත් **'ලෝකෝත්තර සම්මා දිට්ඨිය'** උපදවා ගෙන විද්‍යාව හෙවත් ප්‍රඥාලෝකය තම දිවියට ලබා ගනී. ඒ අනුව පටිච්ච සමුප්පාදය පදනම් කොට ගත් අනිත්‍යතාව පිළිබඳ අවබෝධය ලබා ගනී. මෙහි දී ඇස්, කන්, නාසාදි ඉන්ද්‍රිය මගින් රූප, ශබ්ද, ගන්ධාදි අරමුණු ඔස්සේ බාහිර ලෝකය පිළිබඳ අත්දැකීම් ලැබෙන ආකාරයත් එම අද්දැකීම් ක්ෂණිකව හටගෙන ක්ෂණිකව නිරුද්ධ වන ආකාරයත් නුවණින් දකී. සෑම මොහොතකම රූපාදි අරමුණු ලැබීමේ දී රූප, වේදනා, සඤ්ඤා, සංඛාර, විඤ්ඤාණ යන උපාදානස්කන්ධය හටගෙන නිරුද්ධ වන ආකාරය සමුදය, අත්‍ථංගම, අස්සාද, ආදීනව, නිස්සරණ වශයෙන් දකින ශ්‍රැතවත් නුවණැති ශ්‍රාවකයා දුකෙහි හටගැනීම හා නිරුද්ධ වීම අවබෝධ කර ගනී. හටගෙන නිරුද්ධවන පංච උපාදානස්කන්ධය පිළිබඳ අනවබෝධය දුක ලෙසත්, එම දුකට හේතුව උපාදානස්කන්ධයේ ඇලීම බවත්, එහි ඇලීමෙන් තොරවීම හෙවත් නිවන දුකින් නිදහස් වීම ලෙසත්, ඒ සඳහා මාවත ආර්ය අෂ්ටාංගිය මාර්ගය බවත් වශයෙන් චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධය ලැබේ. මෙම අවබෝධය තවදුරටත් වැඩිදියුණුවීම සඳහා උපදෙස් රැසක් ත්‍රිපිටකයෙහි නොයෙක් තැන සඳහන් ව ඇත. ඒ අතර නාම රූප වශයෙන්, ඇස්, කන්, නාසාදි ඉන්ද්‍රිය වශයෙන්, රූප, ශබ්ද, ගන්ධාදි අරමුණු වශයෙන්, චක්ඛු විඤ්ඤාණ, සෝත විඤ්ඤාණ ආදි විඤ්ඤාණ වශයෙන්, රූප සම්ඵස්ස ආදි ස්පර්ශ වශයෙන්, රූප සම්ඵස්සජා වේදනාදි වේදනා වශයෙන් මෙලෙස විවිධාකාරයෙන් තමාට ලැබෙන අද්දැකීම් සියල්ල අනිත්‍ය වශයෙන් මෙනෙහි කිරීමෙන් ලෝකයට පවත්නා දැඩි ඇල්ම ක්‍රමයෙන් දුරුවන ආකාරය දක්වා තිබේ.

සෑම මොහොතක ම පංචඋපාදානස්කන්ධය ක්ෂණිකව හටගෙන නිරුද්ධවීම් වශයෙන් අත්දැකීම් ලැබේ. මේ පිළිබඳ අනවබෝධය හේතුවෙන් තම අද්දැකීම් ස්ථිරව ගැනීම නිසා තමා දුකට පත්වන ආකාරය නුවණින් දැකීමෙන් එම දුකින් නිදහස්වීම සඳහා හටගැනීම් නිරුද්ධවීම් දැකීමේ නුවණ දියුණු කර ගනී. ඒ සඳහා තමාගේ කය හා සිත මෙනෙහි කිරීම් වශයෙන් කාය, වේදනා, චිත්ත, ධම්ම යන ස්ථාන සතරෙහි සිහිය පිහිටුවා ගනිමින් මෙම අනිත්‍යතාව ලෝක යථාර්ථය ප්‍රත්‍යක්ෂ කර ගැනීමේ අඛණ්ඩ උත්සාහයක නිරත වෙයි. එහි ප්‍රතිඵල වශයෙන් ක්‍රමයෙන් පටිච්ච සමුපාදය පදනම් කොටගත් අනිත්‍යතාව පිළිබඳ අවබෝධය තම ජීවිතය තුළ ස්ථාවර වේ. ඒ සමග රූප, ශබ්දාදි අරමුණු පිළිබඳ ආශාව, බැඳීම ක්‍රමයෙන් අඩු වන අතර ඊට ඇති විරුද්ධත්වය හෙවත් ගැටීම ද ක්‍රමයෙන් පහව යේ. මුලදී බාහිර රූප, ශබ්දාදියෙහි අනිත්‍යතාව ප්‍රගුණ කරන අතර පසුව තම අභ්‍යන්තර ලෝකය තුළින් සියලු ලෝකය අවබෝධ කර ගැනීමේ උත්සාහයක නිරත වේ. එහි ප්‍රතිඵල වශයෙන් යමක් දකින, අසන විට ම ඒ මොහොතෙහි හටගෙන නිරුද්ධවන පංච උපාදානස්කන්ධය නුවණින් දැකීමේ දක්ෂතාවක් උපදවා ගනී. මෙම අවබෝධයත් සමග තම සිතට එන මානසික පීඩා ක්‍රමයෙන් දුරුවන අතර මානසික තෘප්තිය ක්‍රමයෙන් වර්ධනය වේ. බාහිර කිසිදු අරමුණකින් දුකක් ඇති නොවන ආකාරයේ ස්ථාවර මානසික දියුණුවක් ඇති කර ගනී.

**(ලොස් ඇන්ජලිස්හි ධර්මවිජය බෞද්ධ විහාරස්ථානයෙහි බක් පොහෝදා සීලභාවනා වැඩසටහන - 04/05/2015)**